**<u>2026 ජනවාරි මස 06 වන දින පෙරවරු 9.30 ට</u>**
**<u>මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද</u>**
**<u>මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව</u>**

**<u>සහභාගීත්වය:-</u>**

1. නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
30. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
31. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
32. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
33. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
34. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
35. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

| | | | |
|---|---|---|---|
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 51. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.01.06 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2025.12.02 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2025.12.02 වාර්තාවේ 19 වන පිටුවේ මාගේ කතාව පහත පරිදි සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

"මේ වන විට රජය මඟින් දියත් කර ඇති ආපදා සහන ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලට මට පෙර කතා කල මන්ත්‍රීවරුන්ගේ සහයෝගය දැක්වීම පිළිබඳව ස්තුතිවන්ත අතර සමහර මන්ත්‍රීවරුන්ගේ කතා වලට පිළිතුරු නොදී යා නොහැකි බව සඳහන් කල යුතුය. මෙම වැඩ සටහනේ කිසිම තැනක ආපදා තත්ත්වයක් ගැන සඳහන් නොවන අතර මි.මි. 100 ක වර්ෂාපතනයක් ගැන පමණක් කියයි, නමුත් ලංකාවට මි.මි. 100 වර්ෂාපතනයක් ඉතා සාමාන්‍ය තත්ත්වයක් වන අතර මෙහිදී කිනම් ආකාරයකට හෝ ආපදා තත්ත්වයක් සඳහන් නොකරයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2025.12.02 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනට යටත්ව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2025.12.02 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන :-

02(1) ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතාගේ මැණියන් අභවප්ප්‍රාප්ත වී ඇති බව දැනුම් දී තිබෙනවා .

## 03 සභාව අමතා එවන ලද ආයචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

03(1) මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, මා හට වාචිකව කරුණු තුනක් සඳහන් කරන්න තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මල අපද්‍රව්‍ය ව්‍යාපෘතිය මොරටුව කල්දමුල්ල කොට්ඨාසයේ වසර තුනකට වැඩි කාලයක ඉදන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. ඒක සතුටුයි. මොකද ජනතාවට හොද ව්‍යාපෘතියක් නිසා. ඒ වගේම ගරු නගරාධිපතිතුමා මේ සියලු ව්‍යාපෘති කරන්නේ නගර සභාව සතු පාරවල්. එතකොට වරිපනම් ගෙනවන ජනතාව වසර ගණනාවක් තිස්සේ ඒ නිසා බාධා විදින්න සහ ඉතාමත් කරදර තත්ත්වයකට මුහුණපාලා තියෙනවා. ඒ ගමන් කරන පාරවල් මාස දෙකෙන් තුනෙන් කැඩෙනවා. ඒ වගේම තමයි ඒ මාර්ග වල ජනතාව විශාල වශයෙන් ගමන් කරනවා. ඒගොල්ලන්ට සමහරවිට දූවිල්ල නිසා රෝගාතුර වෙච්ච නිවෙස් වල ජනතාව මේ වෙනකොට නිරන්තරයෙන්ම ප්‍රකාශ කරන්නේ ඉක්මනින් මේ ව්‍යාපෘතිය කරලා දෙන්න කියලා. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, ඉතා කඩිනමින් අපේ අවධානය යොමු කරලා මෙම ව්‍යාපෘතිය ඉක්මනින් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා විශේෂයෙන්ම කල්දමුල්ල ප්‍රදේශයේ. ඒ වගේම බොරුපන ප්‍රදේශයෙත් මේ වගේම ක්‍රියාත්මක වෙනවා. එයටත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, කල්දමුල්ල ආතර් පෙදෙසේ මාර්ගය මට ජයන්ත මහතා වාචිකව ප්‍රකාශ කළා ඒ පාර කැඩිලා තියෙනවා. ඒක ප්‍රිමික්ස් දමා හදලා දෙන්න කියලා. ඒ වගේම මෙම කල්දමුල්ලේ අඟුලාන දුම්රියපළ පාරේ, කල්දමුල්ල ආරම්භ වන සැම්සන් ප්‍රනාන්දු මහතාගේ නිවස සිට සුදර්මාරාම පාර දක්වා මාර්ගයත් කැඩිලා තියෙනවා. ඒකත් ඉක්මනින්ම ප්‍රිමික්ස් දමා දෙන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම තමයි කල්දමුල්ල තුන්වන පටුමග ඒකෙත් අතුරු මාර්ගයක් පන්සල අසල සිටි අවසානයේ අවසානය සුදර්මාරාමය පාරේ කාණු පද්ධතියක් නැහැ. ඒ සඳහා මේ ව්‍යාපෘතිය යටතේ අධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(2) මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනොජ් ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා පෙත්සම් යටතේ කොරළවැල්ල චන්ද්‍ර මාවතේ බෝගහක් තියෙනවා මුළු පළාතටම අවහිරයක් වෙන. ඒ නිසා විදුලි රැහැන් ද කැඩී බිඳී ගොස් තියෙනවා. ඒ නිසා ඒ පාරේ කට්ටිය එකතු වෙලා පෙත්සමක් ඉදිරිපත් කරලා තියෙනවා. මම එය සභාගත කරනවා.

03(3) මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනොජ් ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල ගුණවර්ධනාරාම පාරේ ඇති අතුරු මාර්ගයේ වැසියන් විසින් පෙත්සමක් ඉදිරිපත් කරලා තියෙනවා. එම පාර නගර සභාවට පවරා ගන්න කියලා.ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(4)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාවනා පෙත්සම් පැමිණිලි යටතේ ඔබතුමාට මේ මොහොතේ ස්තුතිවන්ත වෙන්න ඕන වසර ගණනාවක් කොරලවැල්ල සමාජීවාදි නිවහන් පෙදෙසේ ජනතාව සැහෙන්න ගැටළුවකට පත්වෙලා වැසි ජලය බැස යන්නේ නැතුව හිටපු මොහොතක, 2018 මන් මන්ත්‍රීවරයෙක් වශයෙන් පත්වෙලා මේ කර්තව්‍ය කරලා දෙන්න කියලා මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් ලක්ෂ දාහතරක් වැනි මුදලක් එවකට වියදම් කරන්න තිබුණු එම ව්‍යාපෘතිය සිදු කරන්න මොරටුව මහ නගර සභාව විසින් අපිට මුදල් ලබා දුන්නේ නැහැ නමුත් ඔබතුමා මේ වර්තමාන ආණ්ඩුව යටතේ කොරළවැල්ල සමාජවාදී නිවහල් පෙදෙසේ ජනතාව පත්වෙලා තියෙන්නේ පීඩාවෙන් ඔවුන්ව මුදවලා ලක්ෂ තිහකට ආසන්න මුදලක් වැය කරලා ඒ කර්තව්‍ය මේ වන විට නිසි ලෙස සිදු කරලා අවසන් කරලා තියෙනවා. ජනතාවගේ ස්තුතියි ඔවුන් වෙනුවෙන් මම පුදකර සිටිනවා. දීර්ඝ කාලයක් තිස්සේ කළ යුතු කාර්යයක් සිදුකරෙ නැහැ වර්තමාන ආණ්ඩුව මොරටුව මහ නගර සභාව ඔබතුමාගේත් හර්ෂන නානායක්කාර මැතිතුමාගේ මැදිහත්වීමෙන් මුදල් ලබාදීලා මේ කරපු කටයුත්ත සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**03(5)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාවනා හා පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ කටුබැද්ද ඩී.එස්. විජේසිංහ මාවතේ හතර වෙනි පටුමගෙ කොටසයි සංවර්ධනය කර තිබෙන්නේ. එම පටුමගේ ඉතිරි කොටස සංවර්ධනය කර දෙන ලෙස එම ප්‍රදේශවාසීන් විසින් පෙත්සමක් ඉදිරිපත් කරලා තියෙනවා මම එම පෙත්සම සභාගත කර සිටිනවා.

**03(6)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා පෙත්සම් පැමිණිලි අයිතම යටතේ, කටුබැද්ද උතුර කොට්ඨාසයෙන් ඉල්ලීමක් ලැබිලා තියෙනවා. කටුබැද්ද සුපර් සිටි වෙළඳ සංකීර්ණයට මාලු වෙළඳසැලක් ලබාදීමට කටයුතු කරන්න කියලා. මම එම ඉල්ලීම සභාගත කර සිටිනවා

**03(7)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා පෙත්සම් පැමිණිලි අයිතම යටතේ, රාහුල මාවතේ ප්‍රනාන්දු උයන කියන අතුරු මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා එම ප්‍රදේශවාසීන් විසින් සිදුකරන ලද ඉල්ලීමක් මා සභාගත කරනවා.

**03(8)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පළමුවෙන්ම මා ඔබතුමාටත් හර්ෂ නානායක්කාර මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මා විසින් ඉදිරිපත් කළ යෝජනාවක් අනුව, සුද්දගෙ මෝල ළඟ විමධ්‍යගත අරමුදලින් ප්‍රතිසංස්කරණය කටයුතු පටන් ගත්තා, දැන් එහි වැඩකටයුතු අවසන් වීගෙන යනවා. ඒ වගේම පන්සල ළඟජනතාව විසින් ලිපියක් ලබා දී තිබෙනවා. ඔවුන් පවසන්නේ වැසි දිනයන් වලදී ජලය පිරීම නිසා මාර්ගයේ ගමන් ගැනීමට අපහසු බැවින් එම ජලය ප්‍රධාන පාරේ කානු පද්ධතියට බැස යාමට සකස් කර දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලා සිටිනවා. මම ඒ ලිපිය සභාගත කරනවා.

**03(9)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වාචික ඉල්ලීමක් තියෙනවා කරන්න. ලුනාව කලපුව ඇවිදින මන්තීරුවේ ඔබතුමා විසින් සාදා නිම කරන ලද ඒ වොෂ් රූම් එකේ ආලෝකයක් නැහැ, ඒ නිසා ඉතාම කඩිනමින් මේ පිළිබඳව සොයලා බලලා එතනට විදුලි බල්බ ලබාදෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(10)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජෙ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද එඩ්වඩ් පටුමඟ සහ මෛත්‍රී පැතුම් පුර නිවාස යෝජනා අතර තිබ්ච්ච විශාල රුක්කත්තනගස, එය එතන තිබුණේ විශාල අනතුරක් සහිතවයි. ඔබතුමා මැදිහත් වෙලා නගර සභා සේවකයන් යොදවලා ඒ ගස කපා ඉවත් කරා. ඒ පිළිබඳව අපගේ ස්තුතියි මේ අවස්ථාවේදී ඔබතුමාට පුදකර සිටිනවා. ඒ වගේම ඉදිබැද්ද එඩ්වට් පටුමඟ විශේෂයෙන්ම මාගේ නිවසට යන මාර්ගය ඒ වගේම ආයුර්වේද බෙහෙත් ශාලාවට යන්න තියෙන්නෙත් එම පාරෙන් එම මාර්ගයේ ස්ථාන කිහිපයක් කඩතොලු වෙලා තිබෙනවා. එම නිසා ඒ තැන් වලට ප්‍රීමික්ස් යොදා සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(11)** <u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, වාචක පෙත්සමක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. මොරටුව මහ නගර සභාව හැටියට අපි මීට වඩා උනන්දු වෙලා වැඩ කරන්න. උදේට එනකොට අපි දකිනවා හරිම අපිරිසිදුයි මේ පාරවල් මිනිස්සු වැඩට යනකොට මේ මාර්ග හරි ලස්සනට තියෙන්න ඕන. පාන්දරම අපි සේවකයන්ව හෝ යොදවල මේ මාර්ග පිරිසිදු කිරීම කරන්න ඕනේ. ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

**03(12)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි මටත් ඒ සම්බන්ධයෙන් පොඩි ඉල්ලීමක් කරන්න තියෙනවා. මොරටුව ප්‍රදේශයේ ජනතාව විසින් පහුගිය නත්තල් සමයේත් අපෙන් විශේෂ ඉල්ලීමක් කරා මේ නගරය පිරිසිදු කරන්න කියලා. බොරුපන ඉඳලා එගොඩ උයනට යනකොට පාර මැද තණකොළ වැවිලා තියෙනවා මීටර් දෙකක් විතර උසට. කවදාවත් මොරටුව නගරය මෙහෙම තිබිලා නැහැ. දෙපැත්තෙ කොළ වැටිලා ගස් කපපු කුණු ගොඩ ගහලා තියෙනවා හැම තැනම. ඇත්තටම මම කණගාටු වෙනවා අපි නගර සභාවේ අවස්ථා ගණනාවකදීම මේ සම්බන්ධයෙන් කතා කරනවා. ඔබතුමාලා ක්ලීන් ශ්‍රී ලංකා කියලා ව්‍යාපෘතියක් කරනවා නමුත් මේ නගරය නාම පවිත්‍ර කරන්න බැරි වෙලා තියෙනවා. මුහුදු සීමාවේ පාර අයිනවල් වල කුණු පිරිලා තියෙනවා කවදාවත් අපි මේ විදිහට මොරටුව නගරය දැකලා නැහැ. අපි ඔබතුමා විවේචනය කරනවා නෙමෙයි නමුත් අපිට පැහැදිලි කළකිරීමක් තියෙනවා. දේශපාලන විවේචන වෙනයි අපි කැමතිනේ අපි මෙතන ඉද්දි මේ මොරටුව නගරය මේ විදිහට තියෙනවට. මේක හරියට කරන්න බැරි නම් අඩුම තරමේ ශ්‍රමදානයක් හරි දාලා මේක කරන්න. පක්ෂ විපක්ෂ සියලු දෙනා එකතුවෙලා මේ නගරය පිරිසිදු කරන්න. පැවති රජයන් තිබුණා නමුත් කවදාවත් මේ වගේ මොරටුව නගරයේ තියෙනවා අපි දැකල නෑ ඒ කාලේ. ඒ නිසා ඉල්ලීමක් කරනවා ඉදිරි සතියේ දී විශාල කණ්ඩායමක් යොදවලා මේවා සුද්ද පවිත්‍ර කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(13)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දික කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් හා පැමිණිලි අයිතමය යටතේ මා හට වාචිකව ලැබුණු පෙත්සමක් ඉදිරිපත් කරනවා. පසුගිය මාස හය හත පුරාවට අපි ජනතාවගේ පැමිණිලි ඉදිරිපත් කළා නමුත් කියන්නට කණගාටුයි ඒ සඳහා ඉන් එකකටවත් තවමත් ප්‍රතිචාරයක් ලැබිලා නැහැ. ජනතා මැසිවිලි එමටයි. මේ මන්ත්‍රීතුමියන්ලා මන්ත්‍රීතුමන්ටත් කියන්නේ ඒ සම්බන්ධයෙන්ම තමයි. මාගේ පුද්ගලික වැඩ කටයුත්තක් සඳහා මම සමරකෝන් ඉඩමට ගියා. සමරකෝන් ඉඩමේ මේ කානු පිරෙන්න කුණු පිරිලා. මදුරුවන් පිරිලා හැන්දෑව හයෙන් පස්සේ ඒ පැත්තට යන්න බැරි තත්ත්වයක් තමයි උදා වෙලා තියෙන්නේ. ඒ තරමම එතැන් ගොඩක් අපවිත්‍ර වෙලා. මේ සම්බන්ධයෙන් විවේචනයක් නෙමෙයි කරන්නේ නමුත් මෙම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මා විසින් පසුගිය දිනක යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවා. අඟුලාන ආදාහනාගාරය සම්බන්ධව. ඒ අදහනාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මුදල් අනුමත වුණා. තවම එම ආදාහනාගාරය ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න ආරම්භ කරලා නැහැ. නමුත් ඒ ආදාහනාගාරයේ කොටස් කිහිපයක් ගලවගෙන ගිහිල්ලා කොරලවැල්ල ආදාහනාගාරය සවිකරලා කියලා ආරංචියක් තියෙනවා. මම එහි සත්‍යතාවය පිළිබඳ ඔබතුමාගෙන් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනවා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ජයන්ති මාවතේ ජීවත් වෙන වැසියන් මගෙන් අහනවා ජයන්ති මාවත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනවද නැද්ද කියලා. එනිසා මට දැනගන්න අවශ්‍යයි මේ කටයුතු සිදු කරනවද නැද්ද කියලා ඔබතුමාගෙන්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

මන්ත්‍රීතුමා, ඒ පාර හදනවා.

## 04. <u>ප්‍රශ්න</u> - නැත

## 05. <u>යෝජනා</u>

**05(01) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මෝල්පේ මැතිවරණ කොට්ඨාශයේ වීර පුරන්අප්පුගම පිහිටි ප්‍රජා ශාලාවේ කළයුතු ප්‍රතිසංස්කරණ රාශියක් පවතී.

01. වහලයේ ලී දිරාපත් වී ඇති බැවින් වහලය පිළිසකර කර සිවිලිමක් යෙදීම.
02. ප්‍රජා ශාලාව මැදින් පිහිටි කොන්ක්‍රීට් කණුව ඉවත් කිරීම.
03. දිරාපත්ව කඩා වැටී ඇති වැසිකිළිය ප්‍රතිසංස්කරණය
04. අක්‍රමවත්ව සිදුකර ඇති විදුලි රැහැන් පද්ධතිය ක්‍රමවත් කිරීම.
05. ප්‍රජා ශාලාවේ පොළොව සිමෙන්ති යෙදීමමෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර දෙන ලෙස සභාව වෙත යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී ඩබ්. ජීවන්ත සුදර්ශන ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(02) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මෝල්පේ මැතිවරණ කොට්ඨාශයේ වීර පුරන් අප්පු ගම ප්‍රජා ශාලාව පිහිටා ඇති නගර සභාව සතු භූමියේ මීට වසර ගණනාවකට පෙර ඉදිකර තිබූ ළමා උද්‍යානයේ ක්‍රීඩා උපාංග සම්පූර්ණයෙන්ම දිරාපත්ව පවතී. එය නැවත ගම්මානයේ දරුවන්ට විනෝද විය හැකි ලෙස සකස් කර දෙන ලෙස යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එල්.ඩී. තිලක් විජේතුංග මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(02) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(03) මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

142 තිබෙන බස් සේවාව මොරටුව සිට පානදුර දක්වා ක්‍රියාත්මක වන අතර, එහි මොරටුව මහා නගර සභා බල ප්‍රදේශයට අයත් කොටස වන මොරටුව සිට අලුත් පාලම දක්වා වේ. මොරටුව සිට අලුත් පාලම දක්වා වන කොටසේ බස් නැවතුම්පොළ නියමිත ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් ජනතාවට බොහෝ අපහසුතා පවතින බව නිරීක්ෂණය වේ. ඒ අනුව 142 දිවෙන බස් මාර්ගයේ මොරටුව සිට අලුත් පාලම දක්වා අවශ්‍ය ස්ථානවල බස් නැවතුපොළ ආවරණය සහිතව ස්ථාපනය කර දෙන මෙන් යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එකසිය හතලිස් දෙක බස් මාර්ගයේ මොරටුවේ සිට පානදුර දක්වා බස් ස්ටෑන්ඩ් දෙකයි තියෙන්නේ. බදු ගෙවන ජනතාව පාරවල්වල හිටගෙන ඉන්න ඕනේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(03) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(04) මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

එගොඩඋයන ධීවරපුර නිවාස සංකීර්ණයේ ඇති ප්‍රජාශාලාව බොහෝ කාලයක සිට අලුත්වැඩියා කර නැත. තවද එහි සිටින කුඩා දරුවන් සඳහා ළමා උද්‍යානයක් අවශ්‍ය කර තිබේ. එම නිසා ප්‍රජාශාලාව අළුත්වැඩියා කර දී ළමා උද්‍යානයක් ස්ථාපිත කර දෙන මෙන් මෙම ගරු සභාවටයෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(04) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(05) මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මොරටුව සිට මෝදර දක්වා බස් මාර්ගයේ මීට කලකට පෙර තිබූ බස් සේවාව මේ වනවිට අත්හිටුවා ඇත. ඒ හේතුවෙන් මෝදර ජනතාව බොහෝ සේ පීඩාවට පත්ව ඇත. මෝදර සිටින ජනතාවට බොහෝ දුරක් පා ගමනින් ගමන් කිරීමට සිදුව ඇත. මේ අතරට පාසල් සිසුන් හා ගර්භනී මව්වරුන්ද

සිටි. එම නිසා මෝදර ජනතාවට මොරටුව සිට මෝදර දක්වා බස් රථයක් ලබා දෙන මෙන් මෙම ගරු සභාවටයෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, සිත්ති මසීනා බක්කර් මහත්මිය විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුවෙ ඉඳලා මෝදරෙට යන්න බස් එකක් තිබුණා ඉස්සර, දැන් ඒ බස් එක නැහැ. කිලෝ මීටර් එක හමාරක් විතර දුර ඉඳලා දරුවෝ පාසල් වලට එන්නේ පයින්. ඒ බස් එක තිබුණා නම් ජනතාවට මෝදර ඉඳලා පානදුරට යන්නත් ඉතාමත් පහසුවක් වෙනවා. ඔබතුමා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරපු බොහෝ ජනතාවක් එතන අසරණ වෙලා ඉන්නවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින මෝදරට බස් රථයක් ලබා දෙන්න කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(05) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(06) මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

ධර්මබන්දු මාවතේ මැදපාරේ තිබූ ගලි මෝටරය නගර සභාව විසින් ගලවාගෙන ගොස් ඇත. එම නිසා එම මාර්ගය වැසි ජලය බැස යන්නේ නැත. වැසි කාලයට සම්පූර්ණ මාර්ගයම ජලයෙන් යටවේ. නිවෙස් වලට පවා මඩ වතුර ගලාගෙන යයි. එම නිසා එහි තිබූ ගලි මෝටරය නැවත සවිකර මෙය යථා තත්ත්වයට පත්කර දෙන මෙන් මෙම ගරු සභාවටයෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් ටික කාලයක් තිස්සේ ඉඳලා ධර්ම බංදු මාවතේ ලොකු ප්‍රශ්නයක් තියෙනවා ජලය බැස නොයෑම සම්බන්ධයෙන්. ධර්මබංදු මාවත නමින් පාරවල් හතරක් තියෙනවා. ඒ පාරවල් හතරෙම ලිපිනයන් තියෙන්නේ ධර්මබංදු මාවත කියලා. ඒ වුනාට හැමදාම ධර්ම බංදු මාවතේ ප්‍රධාන පාර විතරක් පිරිසිදු කරලා යනවා. ඒ පාරෙ ගලි වලවල් තිබුණට මෝටරයක් නෑ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මෝටරයක් සවි කර දෙන්න කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(06) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(07) ගරු නගරාධිපති කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා විසින් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි,**

252 අධිකාරිය මොරටුව මහ නගර සභා ආඥා පනතේ 26 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මොරටුව මහ නගර සභාව සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව ඇතුළුව 2019.10.03 මහ සභා රැස්වීමේ අංක 7(9) 37 යටතේ විෂය පථයන් අනුමත වී ඇති පහත සඳහන් ස්ථාවර කමිටු 09 සඳහා සභිකයන් තෝරා පත්කර ගත යුතු බවට යෝජනා කරන්නීය.

I. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව
II. ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව
III. පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුව
IV. කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුව
V. මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව
VI. ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව
VII. ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව
VIII. ඵලදායීතා හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුව
IX. ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුව

මහා නගර සභා මන්ත්‍රී ඩබ්. ජීවන්ත සුදර්ශන ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මේ සභාවට පත් වෙලා අඛණ්ඩව අවුරුදු 18 කාලයක් විතර අපි මේ කමිටුවලට ඡන්දය දීලා තියෙනවා. හැබැයි කිසිම දවසක මේ වගේ යෝජනාවක් ඉදිරිපත් වෙලා නැහැ නගරාධිපතිතුමනි. කවුරු ඔබතුමාට මේ සම්බන්ධයෙන් උපදෙස් දුන්නද කියලා කියන්න දන්නේ නැහැ. නමුත් මෙහෙම යෝජනාවක් ඉදිරිපත් වෙන්න ඕනේ නැහැ. සාමාන්‍යයෙන් වෙන්නේ න්‍යාය පත්‍රයට එනවා අංගයක් හැටියට මේ කමිටු පත් කිරීම සම්බන්ධව. එතනදී මේ කමිටු පත් කරන්න නීත්‍යානුකූල බලය තියෙනවා. 26 (1) වගන්තිය යටතේ මේක තියෙනවා. මේ යෝජනාව දාන්නෙත් 26 වගන්තිය යටතේ. 26 කියලා එකක් මහා නගර සභා ආඥාපනතෙ නැහැ. 26(1) කියලා තියෙන්නේ. ඒ නිසා මේ 26 කියන එකත් වැරදියි. එතකොට මේ යෝජනාව සම්මත වෙනවා නම්, මේ යෝජනාව ක්‍රියාත්මක වෙනවා නම් අද දවසේ කමිටුපත් කරන්න නීත්‍යානුකූලව බැහැ. හැබැයි මහ නගර සභා ආඥාපනය 26(1) තියෙනවා. සෑම මහ නගර සභාවක් විසින්ම එක් එක් වර්ෂයේ පළමු වරට පවත්වන ඒ සභාවේ සාමාන්‍ය රැස්වීමේදී මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවක්ද වෙනත් ස්ථාවර කමිටු දෙකක්ද, දෙකකට නොඅඩු ගණනක්ද සභාවේ සභිකයන් අතුරින් ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් තෝරා පත් කර ගත යුතුය. කියලා තියෙනවා. මේක මේ යෝජනාවක් දාපු එක වැරදියි. එක්කො මේ යෝජනාව යෝජක නගරාධිපතිවරයා මේක ඉල්ලා අස් කරගන්න ඕනේ, එහෙම නැත්නම් මේ යෝජනාව සම්මත උනොත් එහෙම. අද දවසේ නිත්‍යානුකූලව ඡන්දයක් තියන්න බැහැ. කමිටු පත් කරන්න බැහැ. මහ නගර සභා අඥාපනතේ 26 (1) වගන්තිය යටතේ කමිටු පත් කරන්න පුළුවන් හැබැයි මේ යෝජනාව ඒකට ප්‍රශ්නයක්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, නගරාධිපතිවරයා විදිහට මගේ අදහස තිබෙන්නේ මෙය මීට පෙරත් කරපු එකක්, සම්ප්‍රදායක් ලෙස මේ ආකාරයට කරලා තිබෙනවා. මම කල්පනා කරන්නේ සභාවට යමක් ගේනවා නම් එක්කෝ යෝජනාවක්, එක්කෝ ස්ථාවර කමිටුවක් හරහා ආයුතු එකක් ස්ථාවර කමිටු පත් කරන්න ස්ථාවර කමිටුවකින් ගේන්න බැහැ. ඒ නිසා මහා ගැටුමක් නෑ විවාදයක් නැහැ. මේක පනත්වලට පටහැනි ලෙස හෝ නීති රීතිවලට පටහැනි එකක් නෙමෙයි. අපිට අදහස් හුවමාරුවක් තියෙයි. මම කල්පනා කරන්නේ නගරාධිපතිවරයා ලෙස ස්ථාවර කමිටු පත්කිරීමට අදාළ යෝජනාවක් න්‍යාය පත්‍රයට ගෙනල්ලා එය කරන එක තමයි වඩාත් හොඳ. ඔබ අදහසක් පළ කරනවා මම නගරාධිපතිවරයා හැටියට මගේ අභිමතයෙ තියෙන්නෙ මෙහෙම යමක් ක්‍රියාත්මක

කරනවා නම් එක්කෝ න්‍යාය පත්‍රයේ යෝජනාවක්, එක්කෝ ස්ථාවර කමිටුවක හරහා එන එකක්. ඔය අදහසේ ඉඳලා තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච් සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එක නිවැරදි කිරීමක් කරන්න ඕනේ. මේක සුජිත් පුෂ්ප කුමාර මන්ත්‍රීතුමාගේ විතරක් අදහසක් නෙමෙයි අපි විපක්ෂයේ සියලු දෙනාගේ අදහසක්. ඔබතුමා කියන විදියට මහ ලොකු ගැටුමක් නැහැ මොකද අපි කවුරුත් ස්ථාවර කමිටු පත් කරන්න ඕනේ. අනිවාර්යයෙන්ම මේ මාසය මුල පත් කරගත යුතුයි. පළවෙනි සභාවෙදිම. නමුත් මෙතන තියෙන තාක්ෂණික ප්‍රශ්නයක් තමයි අපි මතු කරන්නේ. මොකද ඔබතුමා කිව්වා මීට කලින් මෙහෙම යෝජනා දාලා තියෙනවා කියලා මමත් මේ සභාවේ හිටිය කෙනෙක් එහෙම යෝජනාවක් දැම්මා කියලා නම් මගේ මතකයෙත් නැහැ. අපි අර මතු කරන කාරණාව තමයි ඔබතුමා කියන කාරණාව යම් කිසි දෙයක් ඉදිරිපත් කරනකොට යෝජනාවක් මගින් නැත්නම් ස්ථාවර කමිටුවක් මගින් වෙන්න ඕනෙ. ඒක හරි ඒ ඔබතුමාම කියන ඔය සම්ප්‍රදාය රීතීන් යටතේ නම් මේ යෝජනාවත් අපි සම්මත කරලා අද කමිටු පත් කරන්න පුළුවන්ද කියන ගැටලුව තියෙනවා. අපේ සුජිත් මන්ත්‍රීතුමා මතු කරේ මේ යෝජනාවක් සම්මත උනාට පස්සේ, ඒ යෝජනාව සභා සම්මත වෙලා ඒ සභා වාර්තාව සම්මත වුණාට පස්සේ තමයි යෝජනාවක් වලංගු වෙන්නේ. කමිටු පත් කිරීම සම්බන්ධයෙන් අපිට කිසිම විවේචනයක් නැහැ, කිසිම ගැටලුවකුත් නැහැ. මේ වචනයත් එක්ක අපට එල්ලෙන්න අවශ්‍යතාවයකුත් නැහැ. අපි කියන මේ තාක්ෂණික ප්‍රශ්නය විසඳගන්න පුළුවන්නම් අපි විශ්වාස කරනවා හොඳයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අනිත් එක තමයි මේකේ එහෙම මේ ස්ථාවර කමිටුවකින් යන්න ඕනෙත් නැහැ යෝජනාවකින් යන්න ඕනෙත් නැහැ මොකද මේ ආඥා පනතේ තියෙන එක. ඒ නිසා මේක කරන්න කිසිම නීතමය බාධාවක් නැහැ. අනිත් එක තමයි මේ ඡන්ද තියන්න යෝජනා කරලා තියෙන ක්‍රමෙත් වැරදියි. මේ ක්‍රමයට තිබ්බොත් එහෙම මේ ක්‍රමයටම තමයි ස්ථාවර කමිටු රැස් වෙන්න වෙන්නෙත්. හැබැයි අපිට න්‍යාය පත්‍රය ඇවිල්ලා තියෙන්නේ එහෙම නෙමෙයි. ඉස්සෙල්ලාම ඉඩම් පිළිබඳ නගර සංවර්ධන ස්ථාවර කමිටුව. එහෙමයි ඇවිල්ල තියෙන්නේ ඒ නිසා මේක එක්කෝ තීන්දු කරන්න ඕනේ මේ න්‍යාය පත්‍රයේ දීල තියෙන අනුපිළිවෙලට ඕනේ ඡන්දය තියන්න. එහෙම නැත්නම් මේ අනුපිළිවෙලට ඡන්දය සකස් වෙන්න ඕනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේකේ බොඩි එක අනුව අපිට තියෙනවා. නීත්‍යානුකූල භාවය 26 වගන්තිය ගැන මෙතුමා මතක් කරා ඒ නිසා ඒක තමයි ගරු නගරාධිපතිතුමනි පූර්වාදර්ශය කියන එකකුත් තියෙනවා. ඒ වගේම අපිට අර කියපු විදිහට ඒ ප්‍රොටකෝල් එක අනුව සකස් විය යුතුයි කියන විශ්වාසයත් මම තියෙනවා. තාක්ෂණානුකූලව සහ විද්‍යානුකූලව එතකොට මේකේ පූර්වාදර්ශය ගත්තොත් මම හිතන්නේ මුදල් කමිටුව මුලින්ම ගන්න එකේ පූර්වාදර්ශය තියෙනවා කඩුවෙල වගේ නගර සභා වල. හැබැයි අනෙකුත් කමිටු පත් කරනකොට ඒ පූර්වාදර්ශය පිළිබඳ කොහොවත් සාධක නැහැ. ඒ නිසා මම හිතන්නේ අපිට මේක නීත්‍යානුකූල ක්‍රමවේදයක් තුල අපිට නීතිය තියෙන නිසා 26 වගන්තියෙන්. එහෙම නැත්නම් තමයි අපි නිත්‍යානුකූලව යෝජනාවක් දාන්න ඕන. ඒ නිසා ඔබතුමා මේක යෝජනාවක් විදිහට නෙමෙයි සම්ප්‍රදායක් විදිහට අන්තර්ගත කරොත් වටිනවා කියලා මම හිතනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ප්‍රජාතන්ත්‍රවාදය ඇතුලේ ඔබට අදහස් දරන්න තියෙන අයිතිය. එකට කිසිම බාධාවක් නැහැ. හැබැයි සභාව පවත්වාගෙන යද්දී ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම විදිහට තීන්දු කරපු එක කිසි පනතකට පටහැනි ලෙස යමක් කියන්නේ නැහැ. ඔබගෙනුත් එහෙම දෙයක් මතු වුණේ නැහැ. ඔබත් අදහසක් ඉදිරිපත් කළා. ඒ නිසා එය විවාදයක් නැහැ මගේ අභිමතේ තියෙන්නේ අද ස්ථාවර කමිටු පත් කරනවා ඒ සඳහා අවස්ථාව මේ.

**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා විපක්ෂයක් විදිහට අපි බැලුවේ තමුන්නාන්සේලා එක සහයෝගයෙන් වැඩ කරන්න. ඒ වගේම පහුගිය කමිටු පත් කිරීමේදීත් පොඩි පොඩි ගැටළුවක් තිබ්බ නිසා අපිට සම්පූර්ණයෙන්ම කමිටුවලට විරුද්ධ වෙන්න සිද්ධ වුණා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් අපිට විනාඩි පහක අවස්ථාවක් දෙන්න කණ්ඩායම් නායකයෝ මුණගැහිලා තීරණය කරලා මේ කමිටු පත් කරන්න අපි සහයෝගය ලබා දෙන්නම්.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, මම දන්නවා ඔබතුමාට දේශපාලන අත්දැකීම් තියෙනවා. මම ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලනවා. දැන් නැවත වතාවක් ස්ථාවර කමිටුවලට විරුද්ධ වීමේ පදනමක් හදාගන්න එකනම් මේ කරන්න හදන්නේ ඔබ නීතිය දන්නවා මේකේ කිසිම නීතිමය හෝ පනතකට හෝ කිසිම පටහැනිකමක් නැහැ. ඔබ ඉදිරිපත් කරන තර්ක ඇතුලෙ තියෙන්නෙ මේ ඉදිරිපත් කරපු ක්‍රමවේදය. ක්‍රමවේදයේ වෙනස්කම් සිදු වෙන්න පුළුවන් පාලනයන්ගේ වෙනස්වීම් සමග ඔබ හිතන පතන විදිහේ වෙනස්වීම් තිබෙයි. මේ යෝජනාවක් සම්මත කරගෙන පත්කර ගැනීම. කිසිම නීතියකට පටහැනි එකක් නෙමෙයි. එහිදි ඔබේ අදහස එකක් මගේ අදහස එකක්. ඒකෙන් කිසි ලෙසකවත් ඔබට අගෞරවයක්, සභාවට අගෞරවයක් කරන එකක් නෙමෙයි. අපේ අදහස් වල වෙනස්කම් තිබෙනවා මම හිතනවා ඔබ මීට පෙර කමිටුවලට විරුද්ධවීමේදී ඉදිරිපත් කරපු තර්කය. ඒක හරි ඒක පනතට පටහැනි දැන් පනතට අනුව යමින් තමයි මේ ආකාරයට පත් කර ගන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

**මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, එහෙමනම් අපිට මේ සභාවට පසුගිය කමිටු පත් කිරීමේදී පසුගිය ජූනි මාසය ඉදිරිපත් කරපු න්‍යාය පත්‍රය අපිට බලාගන්න පුළුවන් වෙයිද කොයි විදියටද තිබුණේ කියලා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ ආණ්ඩු පක්ෂයට හෝ විපක්ෂයට නැත්නම් මොරටු ජනතාවට කිසිදු අහිතකර තත්ත්වයක් නොවෙයි මේ අපි මේ සාකච්ඡා කරන්න වෙලා ගනිමින් ඉන්නේ. ඒ නිසා ඔබට හරි ඔබගේ දැනුමට හෝ අවබෝධයට හරි නොවෙයි. ඔබ මතු කරන සමහර කාරණා ඒ ඔබේ අදහස එයට ඇහුන්කම් දෙනවා. සභාවේ ලේකම්වරයාගේ අවබෝධය ඇතුලෙනේ මේ දේ කරන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච් සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, දැන් මේ කාරණා වල සම්ප්‍රදායක් මේකේ තිබුණා එතකොට මේ සම්ප්‍රදාය දැන් වෙනස් කරලා තියෙනවා. කමිටු පත් කිරීමේ ඉඳලා කමිටුවල ප්‍රමුඛතාවයන් ලබාදීමේ ඉඳලා හැමදේම වෙනස් වෙලා තියෙනවා. යෝජනාව සම්බන්ධයෙන් අපි තාක්ෂණික ප්‍රශ්නයක් මතුකරා

ඒක සම්බන්ධයෙන් අපිට ගැටළුවක් නැහැ. අපි ඒක පැත්තකින් තියමු හැබැයි දැන් මෙතන කමිටු පත් කිරීමේදී ඉස්සෙල්ලාම පත් කරන්නේ මුදල් කමිටුව හැබැයි මේ සභා ඉතිහාසයේ. කවදාවත් මුදල් කමිටුවක් ඉස්සෙල්ලාම පත් කරේ නැහැ. අන්තිමට තමයි මුදල් කමිටුව පත් කරේ. එතකොට ඔබතුමන්ලා මම මේ ඇත්ත කාරණාව සියලු මන්ත්‍රීවරුන්ට කියන්නේ ඇත්ත දේශපාලන කාරණාව අපි දන්නවා. මෙතන තියෙන ගියපාර වුන වරදක් තිබුණා. ඒ පාර ඔබතුමාලත් පිළිගත්තා, නමුත් ඔබතුමාලා සභාව කරගෙන ගියා මුදල් කමිටුව අවසානයට තියලා. මුදල් කමිටුවට ඔබතුමාලා බලාපොරොත්තු වෙන මෙජර්යුරටි එක ගන්න පුළුවන් කමක් වෙන්නේ නැහැ මේ ක්‍රමයටම මේ නිවැරදි ක්‍රමයටම ගියානම්. දැන් ඒ කාරණාව ඔබතුමාලා අවබෝධ කරගෙන ඔබතුමන්ලා දන්නවා මුදල් කමිටුව අවසානයේ තිබ්බොත් ඔබතුමන්ලාට අවශ්‍ය ආකාරයට මුදල් කමිටුව තියාගන්න බැරි වෙනවා කියල මම මේ විශ්වාස කරන්නේ නෑ ආණ්ඩු පක්ෂයට මන්ත්‍රීවරු දෙන්නෙක් හිටියත් විපක්ෂයට මන්ත්‍රීවරු හතර දෙනෙක් හිටියත් මුදල් කමිටුවේ නායකයා ඔබතුමා ඒක නිලබලයෙන් එන එකක් නමුත් මේ වෙලාවෙදි ඔබතුමන්ලා මුදල් කමිටුව ඉස්සරහට ගේන්නේ ඔබතුමන්ලා දන්නවා පස්සට ගියොත් නීති අනුව හැම සභිකයෙක්ම එක් වරක් කමිටුවක් නියෝජනය කළ යුතුයි කියන නීතිය අනුව අවසානයේදී ඔබතුමන්ලා කැමති දෙන්නෙක්ව දාගන්න බැරි වෙනවා එතකොට ඒ දේශපාලන කාරණාව මත තමයි මේක වෙනස් කරලා තියෙන්නේ ඒක තමයි අපිට තේරෙන ඇත්ත කාරණාව, නැතුව මොරටුව ජනතාව වෙනුවෙන් මහා විශාල වෙනස්කමක් වෙනවා මේ වෙනස්කමෙන් කියන එකක් අපිට තේරෙන්නේ නැහැ. අපිට තේරෙන්නේ ඔබතුමන්ලා තමන්ගේ දේශපාලන බලය පවත්වාගෙන යන්න මේක වෙනස් කලා කියලා. අපේ අදහස තමයි විපක්ෂයක් විදිහට මතුකරන්නේ එහෙම නැතුව ඔබතුමා කිව්ව විදියට කමිටු වලට විරෝධය පාන්න අවස්ථාවක් හදා ගන්න අපේ කණ්ඩායම් රැස්වීම්වලවත් කොහෙ තැනකවත් මේ කමිටු පවත්වාගෙන යාමට බාධා වන කිසිම දෙයක් සාකච්ඡාවක් කරලා නැහැ අපි කිසිදු ආකාරයක සභාපතිකම් හෝ බලය අත්පත් කරගැනීමේ කිසිදු ආකාරයක අපි කතා කරලා නැහැ. සියලුම කමිටුවල බලය ඔබතුමන්ලාට ලබා දෙන්නත් ඒ සියළුම කමිටුවලට අවශ්‍ය කරන සහාය ලබා දෙන්නත්, ඔබතුමා දන්නවා මහජන උපයෝගීතා කමිටුවේදීත් අපි ඒ සහයෝගය ඔබතුමන්ලාට ලබා දුන්නා. හෙටත් ඒ ආකාරයමයි කමිටුවලට සහභාගි වුණා සහයෝගය ලබා දුන්නා. ඒ විදිහටම තමයි ඉදිරියටත් වෙන්නේ නමුත් තාක්ෂණික කාරණාවයි අපි මතු කරේ ඒ වගේම මේකෙ දේශපාලන කාරණාවයි මම මතු කරන්නේ මේක ඔබතුමන්ලාගේ දේශපාලනිකව පවත්වාගෙන යාම සඳහා වෙනස් කරගත්තු ප්‍රොටොකෝල් එකක් මිසක් මොරටුව ජනතාවගේ උවමනාව මත වෙනස් කරපු වෙනසක් නෙමෙයි කියන එකයි අපි මතු කරන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මට ඉතාම කෙටියෙන් කියන්න තියෙන්නේ ඔබ මතු කරන තාක්ෂණික ගැටලුව පැත්තේ යමක් තිබුණා ඔබේ අදහසු ඉදිරිපත් කරා අපේ අදහස් ඉදිරිපත් කරා යම් එකඟතාවයක් ආවා දේශපාලන කාරණාවක් ගැන ඔබ මතු කරනවා. දේශපාලන කාරණාවක් තිබෙනවා හැබැයි ඔබ මතුකරන දේශපාලන කාරණාව මුල මැද අග පැටලිලා. එහෙමනම් මුදල් කමිටුවේ මට හිටියේ සාමාජිකයෝ හතරයි ඔබට දෙකයි මෙවර ඔබට තුනයි මට තුනයි. ඔබ ඉදිරිපත් කරපු ඒ සියල්ල ඒ ආකාරයෙන් මොකක්ද ඒකේ තියෙන දේශපාලන පැටලවිල්ල ඒක මම හිතන්නේ තර්කයක් නැහැ. නමුත් මේ තත්ත්වය හොඳ නැහැ. ස්ථාවර කමිටුපත් කර ගැනීමේදී අපි කවුරුත් සභාවක් ලෙස ඉන්න ඕන. අඩුපාඩු පෙන්නලා දෙන්න ඕනේ නමුත් අර පූර්වාදර්ශය එච්චර සුදුසු නැහැ.

## 05(07) I. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2026 වර්ෂය සඳහා මුදල් කමිටුවට සභාපති ලෙස නගරාධිපති නිල බලයෙන් පත්වන අතර මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රි - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
මහ නගර සභා මන්ත්‍රි - සිත්ති මසීනා බක්කර් මහත්මිය
මහ නගර සභා මන්ත්‍රි - ඩී. සමන්ත සිල්වා මහතා
මහ නගර සභා මන්ත්‍රි - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රි - තුසිත් ද සිල්වා මහතා මහතා

## 05(07) II. ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රි - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
මහ නගර සභා මන්ත්‍රි - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
මහ නගර සභා මන්ත්‍රි - හරීෂ් චන්දන පිලානවිතානගේ මහතා
මහ නගර සභා මන්ත්‍රි - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
මහ නගර සභා මන්ත්‍රි - ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා

**<u>මහා නගර සභා මන්ත්‍රි - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මා එම කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රි - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට ඊළඟට ඉන්නෙ කවුද කියලා දැනගන්න ඕන මොකද අපි එකඟතාවයකට ආවා ඒ එක්කම අපි ලැස්තුවක් බාර දුන්නා. මම හිතනවා අපි ඒ එකඟතාවය උඩ ගියොත් හොඳයි කියලා. මේකෙදි අපේ සඳහන් තිබ්බේ. එක සුජිත් පුෂ්පා කුමාර මන්ත්‍රීතුමා, දෙක හරිස් චන්දන මන්ත්‍රීතුමා, අනිත් එක්කෙනා සමීර මන්ත්‍රීතුමා. නමුත් අද උදේ සමීර වෙනුවට අපි මධුරංග මන්ත්‍රීතුමාව ඉදිරිපත් කරා මම හිතන්නේ මේ සභාවේ පක්ෂ විපක්ෂ අපි හැමදෙනෙක්ම මේ සභාව ඉදිරියට ගෙනියන්න ගත් අදහස් වලට ගරු කරනවනම් සහ සභාව වැදගත් ආකාරයෙන් පවත්වාගෙන යනවා නම් මම හිතන්නේ සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා මොන අදහස දැරුවත්, මේ සභාවේ වැදගත් කාරණා පෙන්නලා දුන්න ඒවගේම අකටයුතුකම් පෙන්නලා දුන්න ඒ වගේම දූෂණ අල්ලලා දුන්න මන්ත්‍රීවරයෙක් ඔහු. ඒ අයව පැත්තකට දාලා ගමනක් යනවනම් මම හිතන්නේ ඒක සාර්ථක නැහැ, සාධාරණ නැහැ. ඒ නිසා සමීර ප්‍රභාත් මන්ත්‍රීතුමා ඉල්ලා අස්වුනු නිසා. පුළුවන් නම් පැහැදිලි කරන්න ඊළඟට කවුද ඉන්නේ කියලා. අපිට හයදෙනෙක් අවශ්‍යයි කමිටුවක් පවත්වාගෙන යන්න. ඡන්ද ප්‍රතිඵලය තියෙනවා ඔබතුමාගේ අතේ එම නිසා ඒ සම්බන්ධයෙන් අපිට දැනුම් දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, යම් එකඟතාවයන් මත වැඩ කිරීම තමයි අපේ ප්‍රතිපත්තිය වෙලා තිබුණේ හැබැයි ඒ එකඟතාවයන් මත වැඩ කරද්දි ඔබ ඔබේ කැමැත්ත අනුව මේ නිශ්චිත මොහොතෙත් කමිටු වලට විරුද්ධ වෙනවා, එය ඔබේ කැමැත්ත. එකඟතාවය මත යන ගමන් මන්ත්‍රීවරුන්ට අයිතියක් තියෙනවා පක්ෂ ලෙස මොන එකඟතා තිබුණත් ඔවුන්ගේ කැමැත්තට අනුව ඡන්ද පාවිච්චි කරන්න.

ඒ අනුව මේ වෙනකොටත් විපක්ෂය පැත්තෙන් සමහර ස්ථාවර කමිටු වලට පත්කල යුතු සාමාජිකයින් පිළිබඳව විවිධ අදහස් තියෙනවා. ඒ නිසා මට ඒකාධිපති ස්වභාවයක් වෙන්න බැහැ, එකඟතාවයක් තියෙනවා ඔබ එකඟතාවයට අනුවම කටයුතු කරනවා වගේම, එකඟතාවයට පරිබාහිරව කටයුතු කරයි. ඒක විපක්ෂයට පමණක් පොදු නැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියන එක අපිට පිළිගන්න බැහැ, එකඟතාවය අනුව තමයි අපි මෙය ඉදිරිපත් කරලා තියෙන්නේ. ඔබතුමා කිවුවා මුල් එක වැරදි කියලා. එතකොට අපි තුසිත් මන්ත්‍රීතුමාටත් ඡන්දය දුන්නා. එකඟතාවය කව්රු හෝ කඩලා තියෙනවනම් වැරදියි. ඒ නිසා අපි මෙතන සභාවක් විදිහට ඉදිරියට යනවනම් අපි කැමති පුද්ගලයෝ වෙන්න පුළුවන් එක වෙනම කාරණාවක්. අපි සභාවක් විදිහට යනවනම් ඒ තියෙන ගරුත්වය ආරක්ෂා කරගන්න ඔබතුමා විශ්වාස කරනවනේ එක කරන්න ඕන කියලා. ඒක ආරක්ෂා කරගන්න තමයි අපේ විපක්ෂයේ එකඟතාවය ඔබතුමාට කිවුවේ. ඔබතුමා ඒකාධිපතියෙක් නොවෙනවානම්, සමන්ලාල් නගරාධිපතිතුමගේ කාලේ වුණ දේවල් දැන් වෙන්නේ නැහැ කියලා ඔබතුමා කියනවා. ඒක තමයි වෙන්න ඕන. නමුත් සමන්ලාල්ගේ කාලේවත් මෙහෙම වුනේ නැහැ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැරදි සභාවක් විසින් තීන්දු කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච් සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඉල්ලා අස්වෙලා තියෙනවා. එතකොට ඒ මන්ත්‍රීවරයා අස්වුනාම ඡන්ද විමසීම අනුව ඊළඟ නම කියන්න ඕනේ නැද්ද.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතන දී ඔබතුමන්ලාට කිසිම ප්‍රශ්නයක් නැහැ ඔබතුමාගේ කණ්ඩායමේ ඉන්නවා මන්ත්‍රීවරු 26 ක්. අපි කණ්ඩායම් 7ක් නියෝජනය කරන්නේ මෙතන එක නිසා තීරණ ගනිද්දි පොදු තීරණයක් ගන්න ඕන. ඒ නිසා ඉල්ලීමක් කරනවා මෙතනදී අපි එකඟතාවයකට එමු. අපි කිව්වා කෙළින්ම අපි සභාපතිකම් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාව අපි විශ්වාස කළා ඒ නිසා තමයි නම් 3න් 3 දෙන්න එකඟ වුනේ. ඒ නිසා ඉල්ලීමක් කරනවා ඊළඟට ඉන්න සුජිත් මන්ත්‍රීතුමාව පත් කරන්න කියලා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ඉල්ලා අස්වීම නිසා 2026 වර්ෂය සඳහා පහත නම සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරු ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

| | | |
|---|---|---|
| මහ නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| මහ නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| මහ නගර සභා මන්ත්‍රී | - | හරීෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| මහ නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| මහ නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |

**05(07) III. පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුව**

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

| | | |
|---|---|---|
| මහ නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න සේවාවිතාරණ මහතා |
| මහ නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |

මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
මහ නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා
මහ නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා

**05(07) IV. කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටුව**

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - ඩී. සරෝජනී මැන්දිස් මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
මහ නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ට්ල්කාන්ත මහතා

**05(07) V. මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව**

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
මහ නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - යෝගේෂ ප්‍රියදර්ශන මෙන්ඩිස් මහතා
මහ නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මා එම කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රී ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය ඉල්ලා අස්වීම නිසා 2026 වර්ෂය සඳහා පහත නම සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරු මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
මහ නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - යෝගේෂ ප්‍රියදර්ශන මෙන්ඩිස් මහතා
මහ නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

## 05(07) VI. ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
මහ නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
මහ නගර සභා මන්ත්‍රී - එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා

## 05(07) VII. ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි, 2026 වර්ෂය සඳහා පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

මහ නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - ඩී. එස්. සුසන්ත ඉරෝෂන ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - ටී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
මහ නගර සභා මන්ත්‍රී - ශෙයාන් දුලිප් තිසේරා මහතා

## 05(07) VIII. ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුව

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

